ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත
LP - QD / 52/ News/ 2013

# ළමා ප්‍රදීපය

ක්‍රි. ව. 2013 අප්‍රේල් 15 සඳුදා
05 වෙළුම - 23 කලබ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00



සිතුවම : මේරියන් කායිවෙට්ටි

## කිතුනු සිරිත් විරිත් අළුත් කරන සිංහල අළුත් අවුරුද්දක් !

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.lk

# කිතුනු සිරිත් විරිත් අලුත් කරන සිංහල අලුත් අවුරුද්ද

## ආදරණීය දුවේ පුතේ...

මේ සිංහල අවුරුදු සමයයි. මේ අවුරුදු සමයේදී මුළු මහත් ශ්‍රී ලංකා ධරණී තලයම උත්සවශ්‍රීයෙන් වෙලී යන බවක් දැනෙනවා නේද? ජාති, කුළ මල, ආගම් භේදයන් ගෙන් තොරව මෙම උත්සවයට සිංහලයා එකතු වන්නේ මේ සිංහල අලුත් අවුරුද්ද ජාතික උත්සවයක් වන නිසාමයි. මෙය ආගමික උත්සවයක් නොව පොදුවේ සිංහල දෙමළ ජනතාවට ජාතික උත්සවයක් වන නිසාමයි. නමුත් පුංචි ඔබ සමහර විට මෙහෙම ප්‍රශ්නයක් අහන්න පුළුවන්, මේ උත්සවය බෞද්ධ, හින්දු ආගමිකයන්ට පමණක් සීමාවුනු උත්සවයක් නේද කියා? නැහැ, එය දුර්මතයක්. මේ උත්සවය ජාතික උත්සවයක් නම් එය ආගමික උත්සවයක් වන්නේ කොහොමද? ඒ නිසා සිංහල කතෝලිකයන් මෙම ජාතික උත්සවය සමරන්නට එකතු වනවා. නමුත් එහි වෙනසක් තිබෙනව. මේ වෙනස කුමක්ද කියලත් අපි විමසා බලමු.

ආදර දුවේ පුතේ, මීන රාශියෙන් මේෂ රාශිය කරා හිරුගේ සංක්‍රමණය වීම අරබයා ආරම්භ වන මේ නව කාල පරිච්ඡේදය තුළදී තවත් නව වසරක උදාවක් සංකේතවත් වන බව පිළිගත් සම්මතයයි. නව වසරේ උදාවත් සමඟම එම වසර වැඩදායිකව, සාර්ථකව ගත කිරීම සඳහා සිංහල ජන ජීවිතය හා බැඳී පවතින සිරිත් විරිත් රාශියක්ම තිබෙනවා. ගෙවී යන වසරේ අවසන් දින වැඩ නිමා කිරීම, නොනගතය තුළ භාවනාශීලීව ගත කිරීම, නව වසරේ උදාව සමඟ ගිනි මෙලවීම , ආහාර වැළඳීම, හිස තෙල් ගෑම , වැඩ ඇල්ලීම, නෑදෑ ගමන්, ස්නානය , රැකියාව සඳහා පිටත්ව යෑම ආදි ජීවිතය හා සම්බන්ධ ගනු දෙනු මුල් කොට මේ සියලු සිරිත් විරිත් නිර්වචනය වී තිබෙනවා. මේ දේශයේ බහුතරය බෞද්ධා ගමිකයන් නිසා මේ සියලු සිරිත් විරිත් වලට බෞද්ධාගමික මුහුණුවරක් කා වද්දා තිබෙනවා. ඒ සිද්ධාන්ත අනුව හැඩ ගස්වා තිබෙනවා. නමුත් මේ ආගමික මුහුණුවර මොහොතකට ඉවත් කර බැලුවොත් මෙහි සඳහන් බොහෝ දේවල් සිංහල , දෙමළ ජනයාගේ දෛනික ජීවිතයේ ඉටු වෙන හා වැදගත් අවස්ථාවන්වලදී බැඳී පවතින ධර්මතා පද්ධතියක් බව ඉතා පැහැදිලියි.

ආදර දුවේ , පුතේ දැන් සිංහල බෞද්ධ ජනතාව මේ සිංහල අලුත් අවුරුදු සිරිත් විරිත් ඉටු කිරීමට පෙළඹී ඇත්තේ නැකැත් හෝරාවන් , සුබ මුහුර්තයන් , ජ්‍යොතිෂය අනුගමනය කිරීමෙන් බව පෙනී යනවා. නමුත් සිංහල කතෝලිකයන් වන අපි නැකැත් හෝරාවන් , සුබ මුහුර්තයන්, ජ්‍යොතිෂය අනුව කටයුතු කරන්නේ නැහැ. අපි ඒවා ගැන විශ්වාස කරන්නේ නැහැ. දැන් බලන්න, සිංහල අලුත් අවුරුද්ද තුළ පමණක් නොවෙයි , ජීවිතයේ අනෙක් හැම අවස්ථාවකදීමත් බෞද්ධ ජනතාව මේ නැකැත් , ජ්‍යොතිෂය ආදි දේ ගැන විශ්වාස කරලනේ හැම වැඩක්ම ආරම්භ කරන්නේ. නමුත් සිංහල කතෝලික ජනතාව දෙවියන් වහන්සේගේ ආශිර්වාදය තුළ සැබෑ ලෙසින්ම විශ්වාසය තබලා හැම මොහොතක්ම සුබ මොහොතක් යන විශ්වාසයෙන් කටයුතු කරනවානේ . අන්න ඒ අයුරින් සිංහල අලුත් අවුරුද්ද සමරන්න කිතුනු අපට අසීරු වන්නේ නැහැ. අපි සාමාන්‍ය ජීවිතය තුළත් කටයුතු කරන අයුරෙන්ම සිංහල අලුත් අවුරුද්දත් අපේ පහසු වේලාව තුළ ජාතික උත්සවයක් සේ සලකා සමරන්නට පුරුදු වෙන්න අවශ්‍යයි. ඉතින් සිංහල අලුත් අවුරුද්ද හා බැඳී පවතින සිරිත් විරිත් අපි නත්තල් සමය තුළත් ඉටු කරන්නට පුරුදු වෙලා තිබෙනවනේ. අන්න ඒ විදියට සිංහල අලුත් අවුරුද්ද තුළත් යම් යම් ජාතිකමය දෑ ගැන හැඟීමක් ඇතිව මෙය ජාතික උත්සවයක් බවටම පත් කරගෙන සමරන්නට අපි පෙරමුණ ගනිමු.

ආදර දුවේ පුතේ, බයිබලය අනුව යමින් අපි යම් අධ්‍යයනයක් කළොත් මේ අප්‍රේල් මාසය ගොඩක් වැදගත් වන්නේ කිතුනු අපටයි. නික්මයාම ග්‍රන්ථයේ සඳහන් කරන ''එතෙරවීම'' සනිටුහන් කරන මාසය අප්‍රේල් මාසයයි. ක්‍රිස්තුන් වහන්සේ මරණය පරදා ජයගත් මාසය අප්‍රේල් මාසයයි. අවුරුද්දේ මුල් මාසය ලෙස දෙවියන් වහන්සේ විසින් මිසර දේශයේදී මෝසෙස් හා ආරොන්ට නම් කරන්නට අණ දුන් මාසය අප්‍රේල් මාසයයි. ''සූර්ය සංක්‍රාන්තිය'' සිදුවන මාසය ලෙස ශු. බයිබලය හඳුන්වන මාසය අප්‍රේල් මාසයයි. ජන ජීවිතයේ සියලු චාරිත්‍ර වාරිත්‍ර ඉටු කරන්නට පොරොන්දු දේශය කරා යන ජනතාවට ඒ බව මතක් කරවන මාසය අප්‍රේල් මාසයයි. එසේනම් ඒ චාරිත්‍ර වාරිත්‍ර කිතුනු ක්‍රමය අනුව සිංහල අවුරුද්ද නිමිත්ත කොට ඉටු කරන්නට සිංහල කතෝලිකයාට කොහෙත්ම අසීරු වන්නේ නෑ.

ආදර දුවේ පුතේ දේශයක උත්සවයක් පොදුවේ සමරන්නේ සියලු භේද ඉවත දමායි. එහිදී එක් එක් සංකේත වලට අපි වහල් විය යුතු නැහැ. එසේනම් ජාතික උත්සවයක් සේ සලකා කතෝලික අපිත් මේ උත්සවය ඒ ඇසින් බලා සමරන්නට එකමුතු වෙමු.

**ඔබට ජේසු පිහිටයි.**

සංස්කාරක

ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා

# මැවිල්ල තුළින් දෙවිඳුන් අත්දකිමු.

**"ඇහැළ මලින් ගස් පිරිලා - බලන්න හරි ලස්සනයි.**
**අඹ, රඹුටන්, ජම්බු ඉදිලා - අද හැම තැන හරි හැඩයි...."**

'ආරම්භයේදී දෙවියන් වහන්සේ අහසත් පොළවත් මැවූ සේක,' මෙලෙසින් ශුද්ධ වූ බයිබලයේ කතුවරයා උත්පත්ති පොතේ ඇරඹුම ගෙන ඇත. ඒ මහා ලෝ මැවීමේ කර්තව්‍ය එහිදී බයිබල් කතුවරයා අප ඉදිරියේ තබන්නේ දෙවියන් වහන්සේ තමන්ගේ මේ පුදුමාකාර නිර්මාණය ක්‍රමවත්ව, පියකරුව කළ ආකාරයයි. එය ශුද්ධ වූ බයිබල් කතුවරයාගේම වචනයෙන් සඳහන් වනුයේ ''දෙවියන් වහන්සේ එහි මනහර බව දුටු සේක,'' යනුවෙනි , ලෝ බිහි වූ ශ්‍රේෂ්ඨයින් උසස් නිර්මාණ අද අප හමුවේ තබා ඔවුන් මිය ගොස් ඇත. එම ශ්‍රේෂ්ඨ කර්තව්‍යය තුළින් අප අත්දකිනුයේ එය නිර්මාණය කළ තැනැත්තාගේ පුදුමාකාර බවයි. ශ්‍රේෂ්ඨත්වයයි. නිදසුනක් ලෙස ගත්කල බුදුන් වහන්සේ ලබා දුන් ඒ මහා දර්ශනය බෞද්ධයා සතුව පවතී. බුදුන් වහන්සේ නිවන් ගියද එම දර්ශනය හරහා දකින බුදුන් වහන්සේට බොදු ජනතාව අදටත් නමස්කාර කරති. එසේ නම් දෙවියන් වහන්සේ මවා වදාළ මේ සොබාදහම තුළ කිතුනු අප අත්දකිනුයේ කාවද? අප අත්දකිනුයේ ස්ර්වබලධාරී වූ දෙවියන් වහන්සේවයි.

හිරු නැගෙන විට, සවස හිරු බැසයන විට, ගසක් වැඩෙන විට, එහි කොළ පරවී වැටෙන විට, මනුෂ්‍යයන්ට දෙන්නට බැරි ජීවයක් ඒ තුළ රඳා පවතින විට අපට දැනෙන්නේ ඒ මහා සර්වබලධාරී දෙවියන් වහන්සේවයි. සීතල සුලඟ ඇඟේ වදින කොට අපට දැනෙන්නේ ඒ දෙවියන් වහන්සේගේ ක්‍රමවත්භාවයයි. අසීසියේ විසූ ශු. ෆ්‍රැන්සිස් තුමා ප්‍රබලව තමන්ගේ මිතුරන්ට කියා දුන්නේ , ලෝකයාට හෙළි කළේ ''සඳු' ඔහුගේ සහෝදරිය බවත්, ''හිරු'' ඔහුගේ සහෝදරයා බවත්ය. ඇළ , දොළ, ගංගා, තුරුලතා, සතා සිව්පාවා දැකීමෙන් ෆ්‍රැන්සිස් තුමාට ගම්‍ය වුයේ ඒ මහා බලපරාක්‍රමයාණන් වූ දෙව්ස්වාමින් වහන්සේගේ ආදරයයි. එපමණක් නොව ඒ මහා පුදුමාකාර දේව මැවිල්ල, එනම් සොබාදහම කෙතරම් විශ්මයජනක දසුනක්ද කියා අපට සොබාදහමේම තතු සාක්ෂි දරනු ඇත. ඉන්දියාවේ වෙසෙන සමහර උගතුන් ලෞකික ජීවිතයේ අස්ථිරභාවය අත්දකින විට තමා සන්තක සියල්ල අතහැර තම ඇඳිවතින් හිමාල අඩවියට පිවිසෙන්නේ එම පුදුමාකාර සොබාදහම තුළ ඔවුන් අත්දකින්නාවූ පරම යථාර්ථය නොහොත් අපගේ මහා බලපරාක්‍රමයාණන් වන දෙවියන් වහන්සේව අත්දැකීමටයි. ඔවුන් වහන්සේ හා සමවැදීමටයි. උන්වහන්සේට තම ආත්මය භාර කිරීමටයි.

තවද දෙවියන් වහන්සේගේ මේ මැවිල්ල මහා කලාගාරයක් වැනිය, වන්දනා චාරිකාවක් බඳු වූ අප ජීවිත ගමන උන්වහන්සේගේ මෙම කලාගාරය තුළ රඳවා ගැනීමට පවා උන්වහන්සේගේ මේ විශිෂ්ට මැවිල්ලට හැකි වී ඇත. එයට නිදසුනක් නම්, හිමාල කඳු වැටියේ දක්නට ලැබෙන ලියතඹරා මල කෙතරම් නම් පුදුමාකාරද? මෙසේ පැවසීමට හේතුව එය කාන්තාවන්ගේ ස්වරූපයට ඉතා සමාන වීමයි. එය කෙතරම්ද කිවහොත් තව්සන්ගේ දැහැන බිඳීමට පවා මෙම ලියතඹරා මල සමත් වී ඇත. මෙය දෙවියන් වහන්සේගේ පුදුමාකාර මැවිල්ලක් නොවේද? මේ මොහොතේදී අපගේ සිත් තුළ පැනයක් හට ගනු නොඅනුමානයි. එනම් ස්වභාවදහම තුළ අපට අත්දකින්න හැකි වනුයේ දෙවියන් වහන්සේවද? යන්නයි. සැබවින්ම එය සත්‍යයකි. මුළු විශ්වයේ ඇති සියල්ල දෙවියන් වහන්සේ ස්වකීය බලයෙන් මැවුසේක. සියල්ලම උන්වහන්සේ විසින් මවන ලදි. උන්වහන්සේ නොමැතිව කිසිවක් නැත. මෙසේ අපට කියාපාන්නේ වෙන කිසිවෙකු නොවේ. අපගේ පව්කාර ජීවිතවලට ගැලවීම ලබාදීම සඳහා කුරුසපත් වු අපගේ ගැලවුම්කාරයාණන් වන ක්‍රිස්තුස් වහන්සේය. නැතිනම් අප ශස්තෘවරයාණන්ය. උන්වහන්සේ මෙසේ ප්‍රකාශ කරනුයේ සැබවින්ම ස්වභාවදහම තුළ දෙවියන් වහන්සේව අපට අත්දැකීමට හැකි බව ජේසුස් වහන්සේ සක්සුදක්සේ දන්නා බැවිනි.

තවත් නිදසුනක් මෙයට එක් කළ හැකිය. එනම් අප සියලු දෙනාම ජලය පානයක් ලෙස භාවිත කරයි. නමුත් කිසිවෙක් හෝ සිතුවද මෙහි වසක් විසක් ඇති ද, නැතිද යන්න. මෙතෙක් කලකට කිසිදු කෙනෙක් එසේ පවසා නැත. එය අපගේ විශ්වාසය මත සිදු වුවකි. දෙවියන් වහන්සේගේ මේ මැවිල්ලද එවැන්නකි. එය සදාකාලිකයි. විශ්වාසනීයයි. සත්‍ය හෙළි කරයි. දෙවියන් වහන්සේගේ පැවැත්ම මේ සෑම දෙයකින්ම දිගින් දිගටම ගෙන යන සේක. ඇතැම් විට සොබාදහම තුළ සිදුවන ක්‍රියා තේරුම් ගැනීමට මිනිසාගේ මනස දියුණු වී නොමැති අවස්ථාද ඇත. එවැනි අවස්ථාවලදී හේතුඵලවාදයට අනුව පිළිතුරු සෙවීමට මිනිසා පුරුදු වී සිටියි. නමුත් එයට හෝ කිසිදු විසඳුමක් නොලැබෙන අවස්ථා ඇත. එවිට කිතුනු අපි ශක්තිමත් වනුයේ අප තුළ විශ්වාසය මත පදනම් වීමෙනි. කිසිදු කෙනෙකු නොදකින ගුප්ත ස්වභාවයකින් වෙලී සිටින ස්වභාවදහම තුළ දෙවියන් වහන්සේව අත්දැකීමට අපට හැකි වනුයේ අප තුළ විශ්වාසය ගොඩනගා ගැනීම මෙන්ම,

ඒ තුළ ප්‍රබල වු ජීවමාන බලවේග පසුපස යමින් උච්චතම බලවේගය දෙවියන් වහන්සේ බව අප තේරුම්ගත් දිනයි. කෙනෙකුට ඒ දිනය අද විය හැකිය. තව කෙනෙකුට හෙට විය හැකිය. තවත් කෙනෙකුට තව වසරකින් විය හැකිය. කෙසේ හෝ කිතුනු විශ්වාසය මත ගොඩනැගී සිටින අප එම මොහොත ඉක්මනින්ම උදාකර ගත යුතුය. කාලයත් සමඟ දිනෙන් දිනම සොබාදහම තුළින් දෙවියන් වහන්සේව අත්දැකීමට හැකිවීම කිතුනු අපගේ සැබෑම වාසනාවකි. භාග්‍යයකි. එම වාසනාව තමා සතු කර ගැනීමට අප සියලු දෙනාම අදිටන් කර ගනිමු.

**කේ.ඒ. නිම්නාදි රොද්‍රිගෝ**
සිරිකුරුස විදුහල - ගම්පහ

# ඉවසන්න පුරුදු වෙමු



**වුට් අරුණ පළමු ශ්‍රේණියේ ඉගෙන ගන්නා , පොත් පත් කියවීමට හරිම ආශා කරන, හොඳ කීකරු දරුවෙක්. පන්තියේ වැඩ කටයුතු හොඳින් කරන බැවින් ගුරුතුමියත් ඔහුට හරිම ආදරෙයි.**

පාසල අවසන් වූ පසු, අරුණව ගෙදර කැඳවා ගෙන යාම සඳහා ඔහුගේ පියා දිනපතා පාසලට පැමිණියා. ඉතින් දවසක් අරුණගේ පියා තමාගේ මෝටර් රථය පාසල් ගේට්ටුව අසළ ඇති විශාල මාර ගස සෙවනේ නතර කර, පාසල් සීනුව නාද වන තුරු පුවත්පත කියවන්න පටන් ගත්තා.

**“මං ඒ ලොකු ළමයාට ගැහැව්ව නම් එතකොට රණ්ඩුවක් පටන් ගන්නවා. මම තරහ ගත්තේ නැහැ කියලා එයාට තේරුනාම, එතකොට එයාට රණ්ඩුවක් පටන් ගන්න බැහැනේ”**

පුවත්පත කියවා ගෙන යන විට , ඔහුට ඇහුණා පාසලේ සීනු හඬ. පුවත්පත පසෙක තැබූ පියා අරුණ පැමිණෙන තුරු පාසල දෙස බලා සිටියා. කුඩා ළමුන් රොත්තක්, එක වරම පන්ති කාමර වලින් එළියට දුව ගෙන ආවා. අරුණ හෙමින් සීරුවේ තම පොත් මල්ල උරහිසේ එල්ලා ගෙන පාසල් ගේට්ටුව දෙසට පියමං කළා. හදිසියේම එතැනට පැමිණි ඇඟපතින් තරමක් ලොකු, දෙවෙනි ශ්‍රේණියේ ළමයෙක් අරුණව තල්ලු කරනවා පියා දුටුවා. පියා වහාම මෝටර් රථයේ දොර හැර කකුලක් එළියට දමා ළමුන් දෙසට එන්නට සැරසුනා. අරුණ ලොකු ළමයා මඟ හැර යාමට උත්සහ කරනවා පියා දුටුවා.

නමුත් ලොකු ළමයා නැවතත් අරුණව තල්ලු කළා. පියා දුටුවා මේ වතාවේ ලොකු ළමයට ගහන්න සූදානම් වන අයුරින් අරුණ අත ඔසවනවා. මොහොතක් ඒ ආකාර යෙන්ම අත ඔසවා සිටි අරුණ හෙමින් සීරුවේ අත පහළට දැම්මා. අරුණ අත එසෙව්වත්, තමන්ට ගහන්නට උත්සහ නොකළේ මන්දැයි අරගලයකට අර අදිමින් සිටි ලොකු ළමයට ප්‍රහේලිකාවක් වුණා. එනිසා ඔහු අරුණ කරන්නට යන්නේ කුමක්දැයි විමසිල්ලෙන් බලා සිටියා. මොහොතකට පසු තම පියා මාර ගස අසළ සිට ළමුන් දෙස බලා ඉන්නා බව අරුණ ඇස් කොණින් දුටුවා. පියා දුටු සැනින් අරුණගේ සිතට ඉමහත් සැනසිල්ලක් දැණුනා. ඔහු ලොකු ළමයා මඟ හැර තම පියා දෙසට දිවුවා.

හති දමමින් දුව ආ අරුණ ඔහුගේ පියාගේ කකුලක් බදා ගත්තා. ඔහුගේ පපුව තාමත් ගිඩි - ගිඩි ගා ගැහෙන බව අරුණට හැඟුණා. පියා අරුණගෙන් ඇසුවා ‘‘ඇයි පුතා අර ළමයා ඔයාව තල්ලු කළේ.? ඔයාගේ අතින් වැරැද්දක්වත් වුනාද? ’’කියා.

අරුණ කීවා ‘‘ඒ ළමයගේ හැටි එහෙම තමයි තාත්තේ. එයා හැම ළමයින්වම තල්ලු කරනවා බිමට වැටෙන්න. ළමයි රිදිලා අඬන කොට එයා හිනාවෙනවා. ළමයි ටීචර්ට කියනවා. එතකොට එයා ටීචර්ට කියනවා එයා හයියෙන් යන කොට හැප්පිලා වැටෙන්න ඇති කියලා. ටීචර් දන්නෙ නෑ එයා හිතලා පොඩි ඒගොල්ලන්ව තල්ලු කරනවා කියලා.’’

අරුණගේ පියා ඇසුවා ‘‘ඉතිං පුතා ඇයි ඔයා ගහන්න වගේ ඔයාගේ අත උස්සලත් අත පහළට දැම්මේ? ’’කියල. එතකොට අරුණ මෙහෙම උත්තර දුන්නා ‘‘මං ඒ ලොකු ළමයාට ගැහැව්ව නම් එතකොට රණ්ඩුවක් පටන් ගන්නවා. මම තරහ ගත්තේ නැහැ කියලා එයාට තේරුනාම, එතකොට එයාට රණ්ඩුවක් පටන් ගන්න බැහැනේ. ඒකයි මං අත පාත දාලා තාත්තා ළඟට දුවගෙන ආවේ’’ යැයි අරුණ ඉතාමත් අහිංසකව කීවා. අරුණ ගේ පියා ඉතා ආදරයෙන් අරුණව ලං කර ගත්තා.

‘‘මගේ පුතා කළදේ හරියටම හරි. රණ්ඩුවක් දිග්ගැස්සීමෙන් කවදාවත් රණ්ඩු කෙලවර කරන්න බැහැ. රණ්ඩු වලට මග නො පාදා ඉන්න එක තමයි ඥානවන්තම ක්‍රියාව.’’ යැයි කිවූ පියා අරුණගේ හිස ආදරයෙන් අත ගෑවා.

✍ **ෆ්‍රීඩා විල්ලවරායන්**



2012 වසරේ පැවති තූර්ය වාදක ප්‍රාථමික තරගයේදී සමස්ත ලංකා ශූරතාව දිනා ගැනීමට උඩුබද්දාව ශු. ජුහානාදර්ක් කනිටු විදුහලේ සංගීත අංශයට හැකි විය. විදුහල්පති ඒ.ඒ. හියුබට් මයා සහ සංගීත ගුරු අනුෂා පෙරේරා මිය එම ජයග්‍රාහි ළමුන් සමඟ - මයිකල් කැනිසියුස්




# නිවාස කුටිවලට නව අරුතක්

පාසල් හි නිවාසාන්තර ක්‍රීඩා උළෙලවලදී විශේෂාංගයක් වන්නේ නිවාස කුටි අලංකාර ලෙස සෑදීමයි. අපතේ යන ද්‍රව්‍ය උපයෝගිකරගෙන නිවාසයේ චිත්‍ර ශිල්පයට දක්ෂ දරුවන්ගේ කුසලතාද එළිදැක්වෙන පරිදි ක්‍රීඩාවේ දැනුම බෙදා හරින අපූරු නිවාස කුටියක් කළුතර ශුද්ධවූ පවුලේ කන්‍යාරාමයේ නිවාසාන්තර තරගයේදී දැකිය හැකි විය.

ශ්‍රී ලංකාවේ ඔලිම්පික් තරග නියෝජනයේ සංදිස්ථාන දැක්වෙන ක්‍රීඩා තොරන ලියනිච් නිවාසය සාදා තිබුනි. මෙහිදි, 1896 - පළමු නූතන ඔලිම්පික් උළෙල, 1924 - පළමු ශ්‍රී ලාංකික ඔලිම්පික් නියෝජිනය , 1937 - ලංකා ඔලිම්පික් කමිටුව ආරම්භවිම, 1948 - පළමු ඔලිම්පික් පදක්කම , 2000 - පළමු කාන්තා පදක්කම, 2012 පළමු පැරා ඔලිම්පික් පදක්කම , තොරන තුළ විස්තරාත්මකව දක්වා තිබුනි.

**මහින්ද නාමල්**



සේයා : ප්‍රියන්ත පීටර්ස් (වෙන්නප්පුව)

### මාසික සිතුවිල්ල - මාර්තු මාසය ජයග්‍රාහී නිර්මාණය

නුහුරු මුත් මේ හබල
මගේ පුංචි දෑතට
සූදානම් මමත්
පැද යන්න මේ කොල්ලෑව
දහම් සයුර වෙත,
සමිඳු වරමින පූර්ණව
මසුන් නොව මිනිසුන් දිනන්නට

ශිරාන් බර්ට්‍රම් පෙරේරා
13 ශ්‍රේණිය
ශා. බෙනදික් විද්‍යාලය - කොළඹ 13



සේයා : ටෝනි නිශාන්ත - මහවැව

මාසික සිතිවිල්ල

**මාසික සිතිවිල්ල**
"අප්‍රේල් මාසය"
ළමා ප්‍රදීපය,
අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය
මාවත,
කොළඹ 08.

# 2013 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

## පළමු තේමාව ඇසුරෙන් පළවූ ප්‍රශ්න වලට පිළිතුරු

ගරු ඩේමියන් පෙරේරා පියතුමා

26. නිකලස් කොපර්නිකස් , ගැලීලියෝ ගැලලි, අයිසෙක් නිව්ටන්

27. බැගෑ සිතින් දෙව් සරණ පතන්නෝ භාග්‍ය වන්තයෝය ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේය.

28. ★ අපගේ ජීවිතය තුළ ඇති වන දුක් කම්කටොළු වලදී අප දෙවියන් වහන්සේට බැගෑපත්ව අයැදීම.
★ බලාපොරොත්තු සුන් වූ අවස්ථාවලදී දෙවියන් තුළ බලාපොරොත්තුවේ ජීවිතයක් ඇති කර ගැනීම
★ අසහනයෙන් පෙළෙන විට සහනය දැක්වීම
★ අන්‍යයන්ගේ වේදනාවලදී සහනය දැක්වීම

29. ධනයෙන් බලයෙන් ආර්ථිකයෙන් සමෘද්ධිමත් වීම.
★ නිදහස් නිවහල් පුද්ගලයෙක් වීම
★ සාමූහිකත්වයට හා එක්සත්කමට අවශ්‍යතාවයක් තිබේ.

30. සාගින්නෙන් , දිළිඳුකමින්, නූගත් කමින් පෙළීම
★ නව සමාජීය හා මානසික වහල්භාවයෙන් පෙළීම
★ විවිධ භේදවීම් දැකගත හැකි වීම
★ ප්‍රධාන අදහස් පිළිබඳ එකඟතාවයක් නොමැත.

31. මිනිසා තාක්ෂණය හා විද්‍යාව අනිසි ලෙස යොදා නොගැනීම
★ දැනුම වේගයෙන් පැතිරී යන අතර එයට අනුකූලව මා නිතරම යාවත්කාලීන විය යුතු බව
★ මිනිසාගේ ජීවිතයට අදාළ අවශ්‍ය නිපැයුම් පමණක් තෝරාගත යුතු බව
★ මිනිසා මැවිල්ලේ අයිතිකරු නොව භාරකරුය
★ මිනිසා මැවුම්කරුවකු ලෙස කටයුතු කළොත් ලෝකය විනාශවන බව
★ නූතන තාක්ෂණය අන් අයට බාධාවක් නොවන ලෙස යොදා ගැනීම
★ ආධ්‍යාත්මික ජීවිතය තුළින් මට සියලු දේ ජය ගතහැකි බව.

32. චාල්ස් ඩාවින්ගේ පරිණාමවාදය
★ සුමේරියානු කතාව ★ ප්‍රසාරණය වීමේ න්‍යාය
★ බිග් බැන්ග් න්‍යාය. ★ ලාප්ලස්ගේ නිහාරික කල්පිතය.

33. ක්‍රිස්තුන් වහන්සේ

34. ඇදුරු ඔයෙන් පාගමනින් එතෙර වීම
★ පුත්තලම ප්‍රදේශයෙහි තනි අලියෙකු මෙල්ල කිරීම

35. පොළවේ දූවිල්ලෙන්

36. පිළියෙල කරන ලද රොටී සහ එළවලු ව්‍යංජනයකට

37. ජෝබ් 38. ප්‍රථම මනුෂ්‍යයා වූ ආදම්ය.

39. බුද්ධිය - ස්මරණය - හෘද සාක්ෂිය - නිදහස

40. 1 කොරින්ති 41. වතුර ලේ වීම / කුළුඳුලන් මැරීම

42. මනුෂ්‍යයා තුළ ඇති ආත්මය හෙවත් ස්ප්‍රීත්තුව

43. ඒසව් සහ ජාකොබ්

44. ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමා

45. මිනිසා හා මිනිසා අතර සබඳතාවය බිඳවැටීම

46. දෙවියන් වහන්සේ අප හා සමාන මිනිස් බව ගෙන මෙලොවට වැඩම කිරීම

47. එකම දෙවියන් වහන්සේ බව ඉගැන්වීම ගැලවුම් කරුවාණන්ගේ පැමිණීම ප්‍රකාශ කිරීම

48. මැවිල්ල දියුණු කර ආරක්ෂා කිරීම

49. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ

50. පළමු මැවීමේ කතාව - දෙවන මැවීමේ කතාව



## සිසු නායක පදක්කම් පැළැඳවීම



**දැලතුර සාන්ත රෝගුස් දහම් පාසලේ 2013 වසරේ ශිෂ්‍ය නායක නායිකාවෝ පසුගියදා මීසම් සේවක ගරු නොයෙල් සම්පත් පියතුමා ඉදිරියේ දිවුරුම් දුන්හ. දිව්‍ය පූජාවෙන් අනතුරුව ගරු පියතුමා, සහ ගුරුවරුන් දෙපළ ඔවුන් සමග ජායා රූපයකට මුහුණ දුන් අයුරු. සේයා :- ඩබ්ලිව්. ටී. සී. පෙරේරා**

# රටේ ජීව රුධිරය වන ළමා ඔබ විශ්වාසයෙන් පිරෙන්න.

'රටක ''ජීවරුධිරය '' ළමා පරපුරයි' යනුවෙන් විද්වත් කියමනක් වෙයි. අද ළමා පරපුර යහපත් වුවහොත් අනාගත පුරවැසි පරපුර අනිවාර්යයෙන්ම යහපත් වනු ඇත.

අද ළමා පරපුර එදා ළමා පරපුරට වඩා දැනුම්වත්ය. ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍යයන් සීඝ්‍රයෙන් දියුණු වීමත් සමග දරු පරපුර කරා විශ්ව දැනුම ගලා ඇවිත් ඇත. විශේෂයෙන්ම රූපවාහිනිය හා අන්තර්ජාලය මීට හේතු වී ඇත. මේවායින් යහපත් දෑ උකහා ගැනීම කිසිදු වරදක් නැත.

එහෙත් දුවේ පුතේ, මේවායේ හලා හල විෂද නැත්තේ නොවේ. මේවා පරිහරණය කිරීමේදී සමහර වැරදි මිතුරන් ගෙන් පරිස්සම් වන්න. ඔවුන් ඔබ නොමඟ යවන්නට ඉඩ ඇත.

එවැනි දෙයක් යම්තමින්වත් ඔබට දැනුනොත් හැකි ඉක්මණින් ඔබේ ආදරණීය දෙමාපියන්ට දන්වන්න. දෙමාපිය ඔවදන් පිළිගනිමින් ඒ අවැඩදායක , අන්තරාදායක දෙයින් වහාම අත් මිදෙන්න. ඔබේ මනස කුරුවල් කරවන කිසිදු දෙයකට ඇදී නොයන්න.

ජේසුස් වහන්සේ ළමුන්ට ඉතාම ආදරේ කළා. ළමුන් නොමඟට යවන වැඩිහිටියන්ට ශාප කළා. ළමා වියේ ඔබේ ප්‍රමුඛතාවය දිය යුත්තේ අධ්‍යාපනයටයි. දහම් පාසලද ඔබේ ළමා දිවිය අලංකාර කරනවා.

මේ වර්ෂය ''විශ්වාසයේ වසර'' ලෙස සභාව නම් කර තිබෙනවා. පුංචි ඔබත් දෙවි පියාණන් කෙරේ අපරිමිත ''විශ්වාසය'' ඇති කර ගන්න ඕනෑ. ඒ විශ්වාසය අප තුළ ජනිත කළේ දේව පුත්‍රයාණන් වන ජේසුස් වහන්සේ යි. ඔබ මෙන්ම ළමා වියක් ගත කළ උන්වහන්සේ කුඩා අවධියේ සිට ම විශ්වාසයේ ජීවිතයක් ගත කළා. කිතු දහම අපට දෙසූ ජේසුස් වහන්සේ ගේ ඉගැන්වීම් වලින් ඔබේ ජීවිත ආලෝකමත් කර ගන්න.

විශ්වාසයේ වසර ගැන ලියැවෙන ලිපි කියවන්න. ''ළමා ප්‍රදීපය තුළින් ඔබේ ජීවිතය නමැති ප්‍රදීපය දල්වන්න. සාන්තුවර ජීවිත ගැන ඔබට කියාදෙන ''ළමා ප්‍රදීපය සෑම සඳුදාම මිලදී ගන්න.

ඔබට විශ්වාසයෙන් පිරි ළමා ජීවිතයක් උදා වේවා

**රාගම ඩික්සන් ඇන්ටනි මාමා**

## අවුරුදු සිරිය



**ගස්වැල්වල කොළ හැලිලා දළුත් දමන්නේ**
**පාට පාට මල් පිපිලා හැඩ වැඩ වෙන්නේ**
**කොහාගේ ඒ මිහිරි ගීත අපට ඇසෙන්නේ**
**අවුරුද්දක් උදාවෙලා සිත් පිබිදෙන්නේ**

**රබන් හඬින් ගම්මානෙම කල එළි වෙන්නේ**
**ඔංචිලි වාරම් පද සැම තැන පැතිරෙන්නේ**
**කෙල්ලෝ කොල්ලො එකතුවෙලා දාම් අදින්නේ**
**පුංචි අපට සතුට අරන් අවුරුදු එන්නේ**

**ඉරේෂා ඈන් පැට්‍රිෂියා මැදගම**
11 ශ්‍රේණිය
***ශා. ලුවිස් දහම් පාසල - කොටරූපෙ [රද්දොළුගම]***

# කළමුල්ල මීසමේ කටුකුරුන්ද දහම් පාසලේ දක්ෂ ලේඛකයෝ

## අඳුරට එළියක්

සමිඳුන් අභියස දිලෙමින් දැවෙනා පහන් වෙමු.
ජීවිතයක මහිම ඉගෙන ගනිමු ඒ පහනේ එළියෙන්
යහ දිවියක පිය ගැට පෙළ ඉදිරියේ
නගින්නට දරමු වෙර එක්රොක් වී
අඳුර පරදා ආලෝකයක් වී
දල්වමු නවමු පහනක් වෙන්නට ආලෝකයක්
අඳුරේ තනිවුනු තැවෙමින් දැවෙනා දනටා
වෙමු ආලෝකයක් නිති සැමටා
අඳුර නොසොයා ආලෝකය සොයා
පියමන් කරනට ඉල්ලමු ශක්තිය නිති අපේ සමිඳුන්ගෙන්

මල්ෂිකා ගයාත්‍රි ප්‍රනාන්දු
11 ශ්‍රේණිය
කටුකුරුන්ද දහම් පාසල - කළමුල්ල මීසම



## සඳ

රෑ අහසේ ලස්සන සඳ අපට පෙනෙනවා
සඳ එළියෙන් මුළු රැයම එළිය කරනවා
තරු නිසා තව තව ඔබ ලස්සන වෙනවා
සැමදාමත් තව තව ඔබ ලස්සන වෙනවා

පෝයදාට ඔබේ ලස්සන හොඳට පෙනෙනවා
අමාවක දාට ඔබව නොපෙනී යනවා
ඉන්පසු ඔබ කෙමෙන් කෙමෙන් එළිය ගෙනෙනවා
නැවතත් ඔබ හැඩවැඩ වී එළිය ගෙනෙනවා

බෙවින් මාරීයෝ
07 ශ්‍රේණිය
කටුකුරුන්ද දහම් පාසල - කළමුල්ල මීසම

වැඩමුළුවක ප්‍රතිඵලයක්

## කුරුළු මවකගේ පැතුමක්

පුංචි ගසක් උඩ තැනුවත් කූඩුව
මිනිසුන් ඒවා කඩලා
තවත් ගසක් නෑ ලැගුම් ගන්නට
කූඩුවක් තනලා
දින දෙකැති පුංචි පැටව්
කොහේ තියන්නද සිතුවා
කෑමක් බීමක් නෑ මට දෙන්නට
කුසගින්නේ සිටියා
දිය බිඳක්වත් කොහෙන් සොයන්නද
ගං ඇළ දොල සිඳිලා
කුමක් කරන්නද බිළිඳුණි ඔබ සඳහා
දෙවිඳුන් ඔබ රැකගනී මම දිරියෙන් සිතුවා



නිසලි උත්තරා
08 ශ්‍රේණිය
කටුකුරුන්ද දහම් පාසල - කළමුල්ල මීසම

## සෙනෙහසක මිහිර

සෙනෙහසක මිහිර ලොවට පැතූ අම්මා
කඳුළු සඟවා හිරු ගෙට වැද අම්මා
හිරු කිරණක් මෙන් එළිය දුන් අම්මා
ලොවේ මිහිරි සුවඳ ඔබයි අම්මා

දස මස මව් ගැබ තුළ රන්දා
සෙනෙහසින් ලේ කිරි කළ සන්දා
නිඳා නොනිඳ මහ රය පුරා සැමදා
වාරු ගත්තේ කෙලෙසද ඔබ සැමදා



නිකිනි අවිශ්කා
10 ශ්‍රේණිය
කටුකුරුන්ද දහම් පාසල - කළමුල්ල මීසම



අශේන් නිරූප ප්‍රනාන්දු
06 ශ්‍රේණිය
කටුකුරුන්ද දහම් පාසල
කළමුල්ල මීසම

## ගුරු මව්නි

මගේ මාවතේ පහන ඔබය මගේ ජීවිතයේ එළිය ඔබය
විටක ඔබ මගේ දෙවෙනි මවය
අ යනු ආ යනු කියාදී අධ්‍යාපනය නැමැති
නෞකාව තොටුපළට ළඟා කිරීමට වෙර දැරූ
ඔබට මගේ දිවි තිබෙන තුරා මා ණය ගැතිය
ගුරු මව්නි ගතින් වෙන්ව ගියත් සිතින් වෙන් නොවේවා ගුරු මව්නි
ඔබ මට කියා දුන් ඒ සොඳුරු වදන් කිසිදු අමතක නොවේ ගුරු
මව්නි මගේ මතක පොතේ ඔබේ රුව සදා
සුරකේ ඉතිං මව්නි පතමි දීඝායුෂ ඔබේ ඉදිරි ජීවිතයට

නවින්දායා සලනි
09 ශ්‍රේණිය
කටුකුරුන්ද දහම් පාසල - කළමුල්ල මීසම

# ගෝනවිල මීසමට අයත් කිරාගාර සාන්ත අන්තෝනි දහම් පාසලේ දක්ෂ ලේඛකයෝ

## ගුරු මව



අකුරු කරන්නට ඔබ
පා සෙවනට
ආවා මතකයි ළමාවියේ,
ඔවදන් දී මා යහමඟ යැවුමට
වෙහෙසුනු හැටි මතකයි,
සිප්සතරද, ජීවිතයද, ආදරය ද
ජයගන්නට
කියා දුන්නේ ඔබයි
හිස අත ගාමින් මා දිරි ගැන්වූ ගුරු මව ඔබමයි.

පියුමි මධුවන්ති
10 ශ්‍රේණිය
සාන්ත අන්තෝනි දහම් පාසල - කිරාගාර
(ගෝනවිල මීසම)

## මී මැස්සා



සුවඳ පස්සේ දුවනවා
මලකට පියඹා එනවා
එහි අවුත් මල් පැණි බී යනවා
සතුටින් ඉගිලී යනවා

හිරුෂා ප්‍රබෝධ්‍යා
08 ශ්‍රේණිය
සාන්ත අන්තෝනි දහම් පාසල - කිරාගාර
(ගෝනවිල මීසම)

වැඩමුළුවක ප්‍රතිඵලයක්

## පරිසරය



දෙවිසමිඳාණන් දායාද කළ පරිසරය
ගහ කොළ මල් එල වලින්
පිරුනු පරිසරය
සතා සිව්පාවන්ගෙන් පිරිපුන් පරිසරය
රැක ගත යුතුයි සැමදා පරිසරය

ලිනුෂ චන්දිමාල්
06 ශ්‍රේණිය
සාන්ත අන්තෝනි දහම් පාසල
කිරාගාර
(ගෝනවිල මීසම)

## අයදිනු මැන සමිඳේ




අප කළ පව් වලට අයදිනු මැන දෙවිඳේ
වෙරෝනිකා ඔබෙ ගත පිස දැමුවේ
ජේසුනී ඔබ කුරුසියේ එල්ලී සිටියේ
අප හට කමා වනු මැනවි

දිල්මි හිරුෂා
09 ශ්‍රේණිය
සාන්ත. අන්තෝනි දහම් පාසල - කිරාගාර
(ගෝනවිල මීසම)

# ළමා ලේඛක වැඩමුළු 50 ක් මෙහෙයවයි.....





ගෝනවිල මීසමේ කිරාගාර ශාන්ත අන්තෝනි දෙව්මැඳුරේ එළඹෙන ස්වර්ණ ජයන්තිය නිමිති කර ගෙන, ළමා ලේඛක වැඩමුළුවක් සිල්වෙස්ටර් පිය දහම් ශාලාවේදී පසුගියදා පැවැත්විණි. බෝලවත්ත දිසානායක හා ගෝනවිල මීසම් සේවක ගරු සිල්වෙස්ටර් විජයකුලසූරිය පියතුමාගේ මඟ පෙන්වීම යටතේ දහම් පාසල් ප්‍රධානී ජයවර්ධන මහතා ඇතුළු දහම් ගුරු මණ්ඩලය විසින් මෙය සංවිධානය කරන ලදී. ළමා ප්‍රදීපය සහ ඥානාර්ථ ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතා මෙම වැඩසටහන මෙහෙයවිය. ළමා ලේඛක, යොවුන් වැඩමුළු, ජනසන්නිවේදන හා පුවත්පත් කලාව, ජීවිතාවබෝධ, ශිෂ්‍ය නායක ඇතුළු වැඩමුළු 75 ක් කොළඹ, හලාවත, අනුරාධපුරය, කුරුණෑගල, බදුල්ල, මහනුවර, රත්නපුර යන පදවිවල පවත්වා ඇති කුමර නයනජිත් මහතාගේ 50 වන ළමා ලේඛක වැඩමුළුව මෙදිනට යෙදී තිබීම ද විශේෂත්වයකි. එම අවස්ථාව සැමරීමට කිරාගාර ශාන්ත අන්තෝනි දහම් පාසලේ ගුරු මණ්ඩලය කටයුතු කර තිබිණි. මෙදින අවස්ථාවන් සේයාරුවෙහි දිස්වේ. **(ඩබ්. ඇන්ටන් ජෙරාඩ් ප්‍රනාන්දු)**



# ඉංග්‍රීසි පාඩම විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා

ඉදිරිපත් කිරීම
මයිකල් ඇන්ජලෝ
ප්‍රනාන්දු විසිනි.

පාඩම් අංක : 91

## AMONG සහ BETWEEN

### Among

දැන් අපි බලමු **among** යෙදෙන හැටි. දෙදෙනකුට වැඩි පිරිසක් හෝ දේවල් පිළිබඳව කීමට **among** යෙදෙනවා.

14. Aruna was the most popular person **among** his friends.
(අරුණ වෝස් අ මෝස්ට් පොපියුලර් පර්සන් එමන්ග් හිස් ෆ්‍රෙන්ඩ්ස්)
අරුණ තමයි ඔහුගේ යාළුවන් අතර ජනප්‍රියම කෙනා.

15. She found her necklace **among** her clothes in the suitcase.
(ෂී ෆවුන්ඩ් හ(ර්) නෙක්ලස් එමං හ(ර්) ක්ලෝත්ස් ඉන් ද සූට්කේස්)
ඇයට ඇගේ මාලය සූට්කේස් එකේ ඇඳුම් අතර තිබිල හම්බවුණා.

16. The property had to be divided **among** five sisters.
(ද ප්‍රොපර්ටි හැඩ් ටු බී ඩිවයිඩඩ් එමංග් ෆයිව් සිස්ට(ර්)ස්)
සහෝදරියන් පස් දෙනෙක් අතර දේපල බෙදිය යුතුව තිබුණා.

17. The packet of buscuits was shared **among** the first six winners.
(ද පැකට් ඔෆ් බිස්කට්ස් වෝස් ෂෙයාර්ඩ් එමං ද ෆර්ස්ට සික්ස් වින(ර්)ස්)
ජයග්‍රහණය කළ පළමු හයදෙනා අතර බිස්කට් පෙට්ටිය බෙදා දුන්නා.

18. **Among** the 12 apostles there was one who betrayed Jesus.
(අමං ද ට්වෙල්ව් අපොස්ට්ල්ස් දෙයාර් වෝස් වන් හූ බිට්‍රේඩ් ජීසස්.)
අපෝස්තුළුවරු 12 දෙනා අතර ජේසුතුමාව පාවා දුන් එක් අපෝස්තුළුවරයකු සිටියා.

යම්කිසි කොටසක් හෝ පිරිසක් අතර පවතින යමක්, දෙයක් ගැන කීමටත් **among** දෙනවා.

19. The good news was spread **among** the poor people of that island.
(ද ගුඩ් නිව්ස් වෝස් ස්ප්‍රෙඩ් එමං ද පුවර් පීපල් ඔෆ් දැට් අයිලන්ඩ්)
ඒ දූපතේ දුප්පත් ජනතාව අතර සුබාරංචිය පැතිර ගියා.

20. The disease will break out **among** the children if you do not take precautions.
(ද ඩිසීස් විල් බ්‍රේක් අවුට් එමන්ග් ද චිල්ඩ්‍රන් ඉෆ් යූ ඩූ නොට් ටේක් ප්‍රිකෝෂන්ස්)

ඔබ වැළැක්වීමේ පියවර නොගත්තොත් ළමයින් අතර මේ රෝගය පැතිරී යන්න පුළුවන්.

21. Aruna is **among** the best cricketers in our country.
(අරුණ ඉස් අමං ද බෙස්ට් ක්‍රිකට(ර්)ස් ඉන් අවර් කන්ට්‍රි)
අරුණ කියන්නෙ අපේ රටේ දක්ෂතම ක්‍රිකට් ක්‍රීඩකයෙක්.

22. This is one of the best **among** my collection of books.
(දිස් ඉස් වන් ඔෆ් ද බෙස්ට් අමං මයි කලෙක්ෂන් ඔෆ් බුක්ස්)
මේ මගේ පොත් එකතුව අතරෙ තියෙන හොඳම පොතක්.

23. Rajitha is **among** the most talented artists.
(රජිත ඉස් එමං ද මෝස්ට් ටැලන්ටඩ් ආටිස්ට්ස්)
රජිත, අති දක්ෂ චිත්‍ර ශිල්පීන් අතර ඉන්න එක්කෙනෙක්

24. Rome is **among** the most fascinating cities in the world.
(රෝම් ඉස් එමන්ග් ද මෝස්ට් ෆැසිනේටිං සිටීස් ඔෆ් ද වර්ල්ඩ්)
රෝමය ලෝකයේ වඩාත් චමත්කාරජනක නගරවලින් එකකි.

මීට අමතරව සාමාන්‍ය භාවිතයේදී **between** සහ **among** යෙදෙන අවස්ථාවනුත් තියෙනවා.

25. ***among other features*** a talent contest too will take place during the festival.
(එමංග් අද ෆීචර්ස්, අ ටැලන්ට් කන්ටෙස්ට් ටූ වීල් ටේක් ප්ලේස් ඩියුරිං ද ෆෙස්ටිවල්)
උත්සවයේදී අනිත් දේවලට අමතරව, දක්ෂතා තේරීමේ තරගයකුත් තියෙනවා.

26. ***Among other things*** he was a carpenter too.
(එමං අද තිංග්ස් හී වෝස් අ කාපෙන්ටර් ටූ)
ඔහු කරන අනිත් වැඩ අතරේ, ඔහුට වඩුවැඩත් පුළුවන්.

# ක්‍රිස්තියානි කලාවේ අගතැන්පත් කලාකරුවෝ - උච්ච පුණරුද යුගය (11)



ඒ අතින් වෙනත් ක්‍රිස්තියනි කලා කරුවන්ට වඩා ඔහු ටිකක් වෙනස් ය. ප්‍රා අන්ජෙලිකෝ සාන්තුවරයෙක් විය. මයිකල් ආන්ජෙලෝ සාන්තුවරයකු වීමට සුදුස්සෙකු විය. එහෙත් රාෆායෙල් අති දක්ෂ කලාකරුවෙක් පමණි.

අනුකරණය කිරීමට රාෆායෙල් මයිකල් අන්ජෙලෝට වඩා පහසු විය. නූතන යුගය දක්වාම ආගමික කලාව මත ඔහුගේ බලපෑමට එක හේතුවක් එය ය. ඔහුට පසුව ආ බොහෝ කලාකරුවෝ ඔහුගේ ශෛලීය අනුගමනය කිරීම ආර්ථික වශයෙන් වාසිදායකසේ සැලකූහ. එහෙත් කලා කෘතියක නියම රසවත් භාවය පිළිබඳ ඔහු තුළ වූ සියුම් විනිශ්චය එවැන්නන්ට අත්පත් කර ගත නොහැකි විය. එදාසිට අද දක්වා දහස් ගණනින් බිහිවී ඇති මැඩෝනා චිත්‍රවල ලඳබොළඳ භාවයටද ඇතැම්විට හැඟීම් සවරූපයටද එක හේතුවක් එය ය.

## සාන්ත පේදුරු මහා දෙව්මැදුර තැනීම

රාෆායෙල් හා මයිකල් ආන්ජෙලෝ යන දෙදෙනාගේ කාලය තුළදී ඔවුන්ගේද සහභාගිත්වය ඇතිව රෝමය තුළම විශාල ව්‍යාපෘතියක් අරඹන ලද්දේය. එය සාන්ත පේදුරු මහා දෙව්මැදුර අලුතින් ගොඩ නැගීමය. කොන්ස්තන්තීනු අධි රාජයා විසින් ඉදිකරන ලද රෝමානු බැසිලිකා ක්‍රමයේ දෙව්මැදුර ඒ වන විට අවුරුදු දහසකට වඩා පැරණි විය.

එය කොයි මොහොතක හෝ කඩාවැටිය හැකි තත්වයකට පත්වී තිබුණේය. එම නිසා එය අලුත්වැඩියා කරනු වෙනුවට එය කඩා දමා ලෝකයේ අලංකාරතමද විශාලතමද දෙව්මැදුර බවට පත්විය හැක්කක් එතැනම ගොඩ නැගීමට තීරණය කරනු ලැබුණේය. අසාර්ථක අත්හදා බැලීම් කිහිපයකට පසුව 1506 දී දොනාටෝ බ්‍රමින්ටේ නැමති අතිදක්ෂ ගොඩනැගිලි සැලසුම්කරුවා යටතේ වැඩ ආරම්භ කරනු ලැබුණේය. ඔහුගේ සැලැස්ම අනුව මෙම මහා පරිමාණයේ ගොඩනැගිල්ල ග්‍රීක කුරුසියක හැඩයට එනම් එක හා සමාන දිගැති පලු හතරකින් යුත් කුරුසියක හැඩයට ඉදිවිය යුත්තකි. පලු හෙවත් අතු හතර එක්වන තැනට ඉහලින් විශාල ‘‘ඩෝමයක්’’ හෙවත් බුබුලාකාර පියස්සක් විය.

මෙම ගොඩනැගිල්ලට මෙවැනි නව ස්වරූපය කින් යුත් සැලැස්මක් යොදා ගනු ලැබුවේ එක විශේෂ යටි අරමුණක්ද ඇතිවය. එය නම් ඉතාලි ජාතිකයන්ගේ අප්‍රසාදයට කවදත් ලක්වූ ගෝතික ක්‍රමයේ දෙව් මැදුරුවලට හාත්පසින් වෙනස්වූ ස්වරූපයකින් මෙය තනන්නට ඕනෑවීමය. එම සාන්ත පේදුරු දෙව්මැදුර අවසන් කිරීමට වසර එකසිය විස්සක් ගතවනු ඇත. ඒ අතරතුරේ මුලින් යොදනලද සැලැස්ම කීපවතාවක් වෙනස් වෙනුද ඇත. 1514 දී බ්‍රමින්ටේ සවර්ගස්ථ වූ විට එහි ප්‍රධාන නිර්මාණ ශිල්පියා වශයෙන් රාෆායෙල් පත්කරනු ලැබුණේය. රාෆායෙල් එම සැලස්ම ලතින් කුරුසියක හැඩයට සිටිනසේ එනම් එක පලුවක් අනිත් තැනට වඩා දික්ව සිටින සේ අලුතින් ප්‍රතිසංස්කරණය කළේය.

1520 දී වූ ඔහුගේ මරණය දක්වා, ඔහු එම ගොඩනැගිල්ලේ වැඩපල සංවිධානය කළේය. ඔහුගෙන් පසු 1564 දී මයිකල් ආන්ජෙලෝ එහි තැනීම් කටයුතු බාරගත්තේය. ඔහුද එම සැලැස්ම නැවත වෙනස් කෙළේය. ඔහු ග්‍රීක කුරුසියේ හැඩයට ආපසු ගියේය. බුබුලාකාර පියස්සද බ්‍රමින්ටේ පැතුවාට වඩා විශාල කරන අදහසින් තනා තිබුණු මුක්කු තවත් සවිශක්තිමත් කළේය. ඔහුගේ මරණින් පසු තවත් ශිල්පීන් කිහිපදෙනෙක් එම තැනීම් කටයුතු දිගටම කරගෙන ගියහ. එය අන්තිමේදී අවසන් කරනු ලැබුනේ කාර්ලෝ මැඩර්නා නැමැත්තා විසිනි.

මැඩර්නා මයිකල් ආන්ජෙලෝගේ බුබුලාකාර පියස්ස නොවෙනස්ව රැකගත්තේය. එහෙත් ලතින් කුරුසියක හැඩේට සිටිනසේ එක ශාලාවක් අනිත් තැනට වඩා දීඝ කළේය. එතරම් ගාම්බීර නොවූ මුහුණතකින් හෙවත් ඉදිරිපසකින් ඔහු ගොඩනැගිල්ල අවසන් කෙළේය. ක්‍රි.ව 1626 දී අභිෂේක කිරීමේ පූජෝත්සවයකින් පසුව එය පූජ්‍ය ස්ථානයක් බවට පත්කරන ලද්දේය.

මෙම සාන්ත පේදුරු බැසිලිකාව හෙවත් මහා දේව මන්දිරය තවමත් ලෝකයේ තිබෙන විශාලතම දේවස්ථානය වේ. එහි වඩාත්ම මහිමාන්විත අංශය වනුයේ මයිකල් ආන්ජෙලෝ විසින් නිර්මාණය කරනලද බුබුලාකාර පියස්ස ය. ගොඩනැගිලි ශිල්පයේ මෙන්ම කලාවේද හාස්කමක් සේ සලකනු ලබන එය පිටතින් බැලූවිට මෙන්ම ඇතුළතින් බැලුවිටද අතිශයින් ප්‍රියජනක ය. අර්ධ චක්‍රාකාර දිග සිවිලිමකින් ද කිරි ගරුඬ බිත්ති හා කුළුණු වලින්ද යුත් එහි ඇතුළතින් බැලුවිටද අතිශයින් ශෝබාලංකාරය. එය දෙස බලන කවරෙකුට වුවද එය අතිශයින් විරාජමාන ගොඩනැගිල්ලක් යන හැඟීම ඇතිවේ.

මහා උත්සව වලට ගැලපෙන වාතාවරණයක් එයින් සැපයේ. එය දෙස තරමක් විවේචනාත්මකව බලන අයද නැත්තේ නොවේ. ගෝත්‍රික ක්‍රමයේ දෙව් මැදුරක් තුළ ඇතිවන තරමේ භක්තියක් එය තුළ ඇතිනොවන බවත් එය වන්දනා ස්ථානයකට වඩා ප්‍රදර්ශණාගාරයකට කිට්ටු බවත්, එය තනනු ලැබුවේ දේව මහිමයට වඩා මිනිස් බලමහිමය දැක්වීමට බවත් එවැන්නෝ පවසති.

**සංස්කාරක පියතුමන් විසිනි**

**ඉදිරියට .......**






**සිත්මල් උදන සිල්වා**
03 ශ්‍රේණිය
ලොයොලා විද්‍යාලය
බෝපිටිය



**නීඩ්‍රා සෝරිස්**
05 ශ්‍රේණිය
සාන්ත බ්‍රිජට් කන්‍යාරාමය
කොළඹ 07

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, A4 ( හාෆ්ෂීට් කොලවල ඇඳ ) පාසලේ හෝ දහම් පාසලේ පංති භාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම. පංතිය. පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත,
කොළඹ 08.



**නිමන්තිකා ප්‍රියදර්ශණී**
07 ශ්‍රේණිය
සිදු කුමරි දහම් පාසල
සින්දත්‍රිය, (වයික්කාල මීසම)



**ස්විනි නිරෝමාලි කුරේ**
03ශ්‍රේණිය
සාන්ත මරියා දහම් පාසල
මග්ගොන

**දිනිත් දෙව්ශාන්**
06 ශ්‍රේණිය
සාන්ත
අන්තෝනි
දහම් පාසල
කීරපත්දෙනිය




**දිල්ශාන් සම්පත් ප්‍රනාන්දු**
12 ශ්‍රේණිය
අසිරිමත් දේව මාතා
මහ විද්‍යාලය
මීගමුව





සුදුවර චරිතයක් හඳුනාගනිමු

# ශු. මාක්තුමා

**සුවිශේෂක මාක් තුමා නව ගිවිසුම තුළ කැපී පෙනෙන චරිතයකි. මාක් තුමාගේ මව මරියා වූ අතර ඇය ජෙරුසලම් සභාවේ කැපී පෙනෙන සාමාජිකාවකි.**

පේදුරුතුමාගේ හිතවත් පැරණි මිතුරියක් වූ ඇයගේ නිවසේ මුල් කිතුනු සංඝය රැස් වූ බව ක්‍රියා පොතේ සඳහන්වේ. මෙතුමා පිළිබඳ ව අපට ප්‍රථමයෙන් දැනගන්නට හා අසන්නට ලැබෙන්නේ ශු. පාවුලුතුමන් හා ශු.බාර්ණබස් තුමන් අන්තියෝකියට යන කල ක්‍රි.ව 46 දී මාක්තුමාද ඔවුන් සමඟ සිටි බවයි. පම්පිලියාවේ පර්ගා නුවර දී ඔවුන්ගෙන් වෙන් වී නැවත ජෙරුසලෙමට හැරී ගියේය. දෙවන ධර්මදූත ගමනේදී පාවුලුතුමා එතුමාව ගමනට සම්බන්ධ කර නොගත්තේය. නමුත් බොහෝ ඉක්මනින් මේ දෙදෙනා අතර තිබූ අසමගිය සමථයකට පත්වී දෙදෙනා මිතුරු වූහ.



ක්‍රි.ව. 60 දි පමණ මාක්තුමා මහා අපෝස්තුළුතුමා යන නමින් හැඳින්වෙන පාවුළුතුමා සමඟ කුඩා ආසියාවේ සභාවන් බලන්නට යාමට සූදානම්ව සිටියේය . එහිදී උන්වහන්සේගේ අපෝස්තලික සේවය නිසා ප්‍රසිද්ධියට පත් විය. අද්‍රියාතික් මුහුදේ නැගෙනහිරින් පිහිටා ඇති අකුවිලා රාජ්‍යයේ එතුමා සුභාරංචිය පැතිර වීය. පසුව ඒ පළාත වෙනිසිය නම් විය. මාක්තුමා මෙම ප්‍රදේශයේ සුභාරංචිය දේශනා කළ අතර, ඒ නිසා අදටත් වෙනිසියේ ආරක්ෂක මුනිවරයා ලෙස මෙතුමා සැලකේ.

ක්‍රි.ව. 61 දි පාවුළුතුමා මාක්තුමන් රෝමයට ගෙනෙන ලෙස තිමතිගෙන් ඉල්ලා සිටියේය. ඔහු මේ නගරයේ සිටිය කාලයේදී ඔහු විසින් ලියන ලද සුභා රංචිය ඉතා පැහැදිලිය. මේ සුභාරංචිය ශු. පේදුරු තුමාගේ ඉගැන්වීම් වල ඉතා පැහැදිලි ලෙස සඳහන් වේ.

මාක්තුමා පේදුරුතුමාගේ ලේකම්වරයා සහ භාෂා පරිවර්තකයා ද විය. නව ගිවිසුමේ පළමු හා ඉපැරණිම සුභාරංචිය රචනා කළේ මාක් තුමාය. එය ලියන ලද්දේ රෝමයේ සිටි නීරෝ අගරජගෙන් පීඩාවන්ට පත් කිතුනුවන්ටය. එහි තේමාව වුයේ ජේසු සමිඳුන්ගේ විරත්වය හා දේවත්වය පෙන්වා දීමටය.එම නිසා එය ප්‍රාතිහාර්ය වලින් හා දේව බල ප්‍රකාශන වලින් යුක්තය.

මාක්තුමා ජේසු සමිඳුන්ට පෙන්වා සිටින්නේ මිනිසුන් විසින් ප්‍රතික්ෂේප කරන ලද නියෝජිතයා ලෙසය. එය ලියන ලද්දේ පේදුරු සහ පාවුලුතුමා උකුත් වූ පසුවය. එනම් ක්‍රි.ව. 65 - 70 අතරය. මාක්තුමා අපෝස්තුළුවරුන්ගෙන් කෙනෙකු නොවේ. එතුමා ඇලෙක්සැන්ඩ්‍රියාවේ ප්‍රථම අගරදගුරුතුමා විය. එහි දි මෙතුමා මිය ගිය අතර, පසුකලෙක වෙනීසියෙන් පැමිණි හේ- වායෝ මාක්තුමාගේ මෘත ශරීරය ඇලෙක්සැන්ඩ්‍රියා නගරයෙන් ගෙන ගොස් වැනිසියේ ශා. මාර්කු බැසිලිකාවේ තැම්පත් කරන ලදි. මාක්තුමාගේ සංකේතය වනාහි සිංහ රුවකි. එහි අර්ථය නම් එතුමාගේ ශුභාරංචිය ආරම්භ වන්නේ ස්නාවක ජොහාන් තුමාගේ දේශනාවෙනි. මෙතුමාගේ සුභාරංචිය දුක්ප්‍රාප්තියේ සුබවදන ලෙස ද හැඳින්වේ

**අසේල දසනායක**



## ප්‍රහේලිකා අංක 37

හරහට

1. යහපත් සමරිතානු වරයාගේ උපමාවේ සොරුනට අසුවූ මිනිසා ගමන් කරමින් සිටියේ මෙම නගරයටය.

4. යහපත් සමරිතානු වරයා සොරුනට අසුවූ මිනිසා ලඟට ගොස් තෙල් සහ මිදියුෂ ගල්වා ........බැඳ තමාගේ මෘගයා පිට හිඳුවා තානායමට ගෙන ගොස් ඔහු බලා ගත්තේය. මෙහි හිස්තැනට සුදුසු වචනය .

5. තමාට විරුද්ධව පව් කරන සහෝදරයාට කමා විය යුත්තේ මෙපමණක් දක්වා පමණදැයි පේදුරුතුමා ක්‍රිස්තුන් වහන්සේගෙන් ඇසුවේය.

7. ක්‍රිස්තුන් වහන්සේගේ ගෝලයෝ උපවාස නොකරන්නේ මන්දැයි ක්‍රිස්තුන් වහන්සේගෙන් ඇසූ අවස්ථාවේදී ''.......... තමන් සමග සිටියදී ඔහුගේ ඥාති මිත්‍රාදින්ට ශෝක විය හැකිදැයි'' උන්වහන්සේ වදාළ සේක. හිස්තැනට සුදුසු වචනය

10. ලාසරස්තුමාගේ එක් සහෝදරියකගේ නම

පහළට

1. ක්‍රිස්තුන් වහන්සේ රාජ තේජසින් මෙම නගරයට වඩිනා විට ''සමිඳුන් නමින් වඩිනා රජුට ආසිරි වේවා'' යි කියමින් මිනිසුන් දෙවියන් වහන්සේට ප්‍රශංසා කළෝය

2. ස්නාවක ජුවාම් තුමා මිනිසුන්ව බව්තීස්ම ස්නාපනය කළේ මේවායින් බවත්, ක්‍රිස්තුන් වහන්සේ පැමිණි පසු ශුද්ධාත්මයාණන්ගෙන්ද, ගින්නෙන්ද මිනිසුන්ව බෞතීස්ම ස්නාපනය කරන බවත් ජුවාම් තුමා ප්‍රකාශ කළේය.

3. කුරුසිය දරාගෙන මා අනුව නොඑන තැනැත්තාට මාගේ ......... විය නොහැකිය'' යනුවෙන් ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. හිස්තැනට සුදුසු වචනය

6. අංශබාග රෝගියාව සුවකර ගැනීම සඳහා ක්‍රිස්තුන් වහන්සේ ඉදිරියට පැමිණෙව්වේ මෙට්ටයක තබා නිවසේ මෙය තුළින් පහළට බැස්ස වීමෙනි.

8. ගෝලයන් සැත්තෑ දෙනාගේ ධර්මදූත මෙහෙය අවසානයේදී ක්‍රිස්තුන් වහන්සේ වෙතට හැරී ආ විට ඔබගේ ......... ස්වර්ගයෙහි ලියා ඇති නිසා සංතෝෂ වන්නැයි ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

9. ක්‍රිස්තුන් වහන්සේ තම දුක් ප්‍රාප්තියට පෙර ගෝලයන්ට කථා කරමින් ''මම ඔබහට සැබැව පවසමි. මාගේ නික්ම ...... ඔබගේ ශුභ සිද්ධිය පිණිසය'' යි කී සේක. හිස්තැනට සුදුසු වචනය.

(මෙම ප්‍රහේලිකාව පිරවීමේ දී පහත සඳහන් බයිබල් පාඨ ද උපයෝගී කර ගත හැකිය. ශු. ලූක් 3,5,10,11,14,19 පරිච්ඡේද , ශු. මතෙව් 9, 18 පරිච්ඡේද ශු. ජුවාම් 16)

**සැකසුම :- තිළිණි දුතිකා පෙරේරා - කිරිමැටියාගාර**

# සමිඳු ප්‍රේමය



**ආදර ජේසුනි**
**එදා ඔබ වහන්සේ**
**කර තබාගෙන ගියේ**
**ලී කුරුසියක් නොවේ**
**මගේ පාපයන්ය.**
**මම ඔබ වහන්සේට දුන්නේ**
**පුංචි දුකක් නොවේ.**
**එහෙත් ඔබ වහන්සේ**
**මට වෛරකළේ නැත**
**මම දුන්නේ ඔබ වහන්සේගේ හදවතින් ගලාගෙන ආ ආදරයයි.**
**ඔබ වහන්සේ මරණයෙන් උත්ථාන වීම මට ලැබුණු ලොකුම**
**සතුටයි, සැනසීමයි. ඔබ වහන්සේ කොයිතරම් ආදරයක්**
**මට දුන්නාද කියා සිතෙන විට මගේ පාපයේ බරපතළ කම**
**තදින් දැනුණි. සමාවෙන්න ජේසුනි මින් මතු මම**
**ඔබ වහන්සේට පව් නොකරන්නට පොරොන්දු වෙමි.**
**මට හැමදාමත් ඔබවහන්සේගේ ආදරය තුළ**
**ජීවත්වීමට මග පෙන්වුව මැනව.**

**දුලාජ් චංදිම අමරතුංග - 7 ශ්‍රේණිය**
**උත්ථානවූ කිතු සමිඳුන්ගේ දහම් පාසල - දංකොටුව**

රත්නපුර මීසමේ මහ සිකුරාදා පාදනමස්කාර වන්දනාවට රත්නපුර සාන්ත පේදුරු පාවුළු දහම් පාසලේ ළමුන් සහභාගිවූ අයුරු.



**තියබෝල්ඩ් සමරතුංග**


අකීකරු පුත්‍රයා 2
යේසුස් තුමාගේ උපමා කථා ඇසුරෙනි..
චිත්‍ර කථා රචනය
ආනන්ද කල්දේරා
චිත්‍ර:- පාලිත සපුආරච්චි
පියාගෙන් ලබාගත් වස්තුවද රැගෙන අන්‍ය පළාතකට ගොස් විශාල නිවසක් මිලදී ගෙන දාසි දස්සන් සමග පදිංචි විය.. හෙතෙම නැවතත් නරක මිතුරන් ඇසුරු කරන්නට විය.. ඔවුන් සමග හොඳට කා, බී විනෝදවූ අතර දවස ගානේම උත්සව පවත්වන්නට විය..
අපි කමු, බොමු... විනෝද වෙමු...
චිලිං..!!
හොව මැරුණොත් හිතට සැපයි ..ජොලි කරපල්ලා..
කෙසේ නමුත් දවසෙන් දවස තිබුන ධනය අඩුවූ අතර ටික දවසකින් හෙතෙම දුප්පතෙක් බවට පත්විය.. තමන් අතර සිටි යහළුවන් ඔහුව හැරදා.... ගොස් තිබින.....
සල්ලි තියෙනකං තමයි කාවිරුත් බලන්නෙ.. කෝ මට හිටිය යාළුවො..? අද.. එකෙක්වත් නෑ ....
වැරහැලි හැඳගත් හෙතෙම ගෙන් ගෙට ගොසින් කෑමට යමක් ඉල්ලා සිඟමන් යදින තත්වයට පත්විය...
..මේ.. අසරණයාට.. දවස්.. ගානකින් කන්ඩ ලැබුනෙ නෑ කෑමට යමක් දෙන්න..
මෙසේ සිඟා කමින් ටික කලක් ජීවත්වූ ඔහුට...ඌරු කොටුවක ඌරන් බලාගැනීමේ රැකියාවක් ලැබුනි...
ඔඩගින්න ඉවසන්න බෑ.. ඌරන්ට දෙන කෑමවත් මට කන්න දෙන්නෙ නෑ...මට මෙහෙම වුනේ මගේම වරදින්...
දැන් ඉතිං මට යන්න එන්න දිහාවක් නෑ මට කරන්න දෙයකුත් නෑ.. යන්න ඕනි පියාණන් ළඟට වත් මගේ පියාණන් මාව අත්හරින එකක් නෑ.. ගිහින් මගේ දුක කියන්න ඕනි...!

ශු. ප්‍රැන්සිස් මුණිඳුන්ගේ

කතාව

# අසීසි නගරයේ දිළින්දා

ඉදිරිපත් කිරීම —

අමල් ද සිල්වා —

19

